


# පසුතැවෙන්න එපා!
# ඔබට පිහිටවෙන්න
## නීති ආධාර කොමිෂන් සභාවේ අප සූදානම්...

ළඟම පිහිටි නීති ආධාර මධ්‍යස්ථානය වෙත පැමිණ
ඔබට අවශ්‍ය නීති උපදෙස් සහ නීතිඥ සේවා
**කිසිදු අයකිරීමකින් තොරව** ලබාගන්න.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ පණිවුඩයකි



අපි හැමෝටම ජීවිතේ ප්‍රශ්න තියනවා. ඒ ප්‍රශ්න අතරේ නීතිමය ප්‍රශ්නවලට මුහුණ දෙන්න වුණාම අපි හැමෝම අසරණ වෙනවා. **නඩුවලට වියදම් වෙන ගාස්තු ගෙවා ගන්න බැරි නිසාම අපිට වුණ අසාධාරණය ඉවසගෙන පාඩුවත් අපිම දරා ගන්නවා.** මේ වගේ වෙලාවක අපි වෙනුවෙන් පෙනී ඉන්න ආයතනයක් තියෙනව නම් කොච්චර හොඳද කියල ඔබට අනන්තවත් හිතෙනව ඇති.

ඇත්තටම නීති ආධාර දෙන රාජ්‍ය ආයතනයක් අපේ රටේ තියෙනවා. කිසිදු අය කිරීමකින් තොරව නීතිමය උපකාර අවශ්‍ය ජනතාවට උදවු කරන මේ ආයතනය තමයි **'නීති ආධාර කොමිෂන් සභාව'**. **1978 අංක 27** දරන පනත මගින් මෙම කොමිෂන් සභාව පිහිටුවා ඇති අතර කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව රට පුරා උසාවි සංකීර්ණ අසූ හතරක නීති ආධාර මධ්‍යස්ථාන ක්‍රියාත්මක වෙනවා. මෙම ආයතනයෙන් සපයන සේවාවන් පිළිබඳව දැනුවත් වී ඔබ අවට ජීවත්වන අයවත් දැනුවත් කරන්න අපි ඔබට ආරාධනා කරනවා. නීති ආධාර මධ්‍යස්ථානවල සේවය කරන නීතිඥ නෝනලා සහ මහත්වරු කිහිපදෙනෙක් අපිට නීති ආධාර කොමිෂන් සභාවේ කටයුතු ගැන කියලා දුන්නේ මේ විධියට...





ඒ කියන්නෙ සර්.. නීති ආධාර ලබාදෙන්නෙ යම් ආදායම් මට්ටමක් සලකා බලල ද?
මූලික වශයෙන්ම අපි ලබාදෙන නීති ආධාර වර්ග දෙකකට බෙදන්න පුළුවන්. එකක් තමයි තමන්ගෙ ආර්ථික අපහසුතා නිසා නඩුවක් සඳහා නීතිඥ ගාස්තු ගෙවා ගත නොහැකි අඩු ආදායම්ලාභීන්. මාසික ආදායම රුපියල් විසි පන්දහසට (25,000/-) වඩා අඩු පුද්ගලයන්ගේ නඩුවලට කිසිදු අය කිරීමකින් තොරව පෙනී සිටීමට නීතිඥවරයෙකු ලබාදෙනවා. (සලකා බලන අදායම් මට්ටම කලින් කලට වෙනස් වෙන්න පුළුවන්)
දෙවෙනි කොටස තමයි නීතිඥවරයාට ගාස්තු ගෙවීමට හැකියාව ඇති නමුත් මූලික වශයෙන් නීතිමය කරුණු පිළිබඳ උපදෙස් බලාපොරොත්තුවෙන් අප වෙත පැමිණෙන පිරිස. ඔවුන්ට අවශ්‍ය උපදෙස් අපේ නීතීඥවරුන් විසින් නොමිලයේ ලබාදෙනවා.
මේ දෙකේම තියෙන විශේෂත්වය තමයි කිසිදු අය කිරීමකින් තොරව අදාළ සේවාවන් ලබාදීම.
කොහොමද මිස් සේවාවන් ලබාගැනීමට පැමිණෙන පුද්ගලයන්ගේ මාසික ආදායම තහවුරු කර ගන්නේ ?
අපි විශ්වාස කරනවා අපි ළඟට එන්නේා ඇත්තටම ආර්ථික අපහසුතා තියෙන පුද්ගලයන් කියලා. ඔවුන් අපට විශ්වාසයි. ඒත් අපි රාජ්‍ය ආයතනයක් නිසා ගමේ ජනතාවට වඩා සමීපම රාජ්‍ය නිලධාරියා වන ග්‍රාම නිලධාරීවරයා විසින් නීති ආධාර ඉල්ලුම්කරුගේ ආදායම පිළිබඳව ලබාදෙන සහතිකයක් අරගෙන එන්න කියලා ඉල්ලා සිටිනවා. අත්‍යවශ්‍යම අවස්ථාවල දී පමණක් අදාල ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් අයදුම්කරුගේ ආදායම පිළිබඳ විමසීමක් කරනවා.


'ගම' කියල කිව්වම සර් මට මතක් වුණේ අපේ ගමේ ඉන්න අම්ම කෙනෙක්ගෙ කතාව. දරුවන් තුන්දෙනෙක් එක්ක ඈය අසරණ වුණේ ඈගේ සැමියා ඔවුන් දාලා ගිහින් වෙන විවාහයක් කර ගත්ත නිසා. දරුවන් වෙනුවෙන් නඩත්තුවක්වත් ගන්න ඒ අම්මට උදව්වක් ගන්න පුළුවන් ද ?
ඔබට මම ස්තූතිවන්ත වෙනවා, ඔබ ගැන විතරක් නෙමෙයි අපෙන් සේවාවන් ලබා ගන්න පුළුවන් අනිත් අය ගැනත් අවධානය යොමු කරන එක ගැන. විශේෂයෙන්ම නඩත්තු නඩුවල දී අපි ඒ කාන්තාවගේ තරාතිරම හෝ මාසික ආදායම නොසලකා හැර අවශ්‍ය නීති ආධාර ඕනෑම කාන්තාවකට සහ ළමයකු වෙනුවෙන් ලබාදෙනවා.
ඒ වගේම ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වන කාන්තාවන් සහ ළමයින්ට ද ආදායම් සීමාවන් නොසලකා අවශ්‍ය නීති ආධාර නොමිලයේම ලබාදෙනවා. එයින් අදහස් වෙන්නේ අපගේ සේවය සැලසීමේදී කාන්තාවන් සහ ළමුන්ට විශේෂ සැලකීමක් ලැබෙන බව.
නොමිලයේ නීතිඥවරුන් පෙනී සිටින්නේ කුමන ආකාරයෙන් අසාධාරණයට ලක්වූ පුද්ගලයන්ගේ නඩු සඳහා ද කියල මිස් මට පැහැදිලි කරල දෙනව ද?
අපි මුලින් කිව්වා වගේ නඩත්තු නඩු, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට අදාළ නඩු, රිය අනතුරු සඳහා වන්දි ලබාගැනීමේ නඩු, දික්කසාද, භාරකාරත්ව නඩු, ඉඩම් නඩු/දේපළවලින් නෙරපීම පිළිබඳ නඩු, මුදල් ගනුදෙනු පිළිබඳ නඩු, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ නඩු, වසරකට වැඩි කාලයක් ඇප ලබා ගැනීමට නොහැකිව බන්ධනාගාරගතව සිටින අඩු ආදායම්ලාභී සැකකරුවන් පිළිබඳ ඇප නඩු, කම්කරු විනිශ්චය සභාවල පවත්නා නඩු, ණය සහන මණ්ඩල/ගෙවල් කුලී සහන මණ්ඩල/ඉඩම් බේරුම් කිරීමේ මණ්ඩලය/පරිපාලන අභියාචනා විනිශ්චය සභාවල පවතින නඩු කටයුතු සඳහා පෙනී සිටීම ආදී බොහෝ නඩු සඳහා කිසිදු අය කිරීමකින් තොරව නීතිඥ සහාය ලබාදෙනවා.
මේ නඩු සඳහා පෙනී සිටීම පිළිබඳව විස්තරාත්මක තොරතුරු දැන ගන්න ඔබට ළඟම පිහිටි උසාවි සංකීර්ණයේ ඇති නීති ආධාර මධ්‍යස්ථානයට එන්න කියලා අපි ආරාධනා කරනවා.



**නීති ආධාර ලබානොදෙන අවස්ථාත් තියෙනව ද ?**



ඔව්. බෙදුම් සහ බූදල් නඩු සඳහා ඉතා විශේෂ අවස්ථාවල දී හැර නීති ආධාර කොමිෂන් සභාව පෙනී සිටින්නේ නැහැ.

**නීති ආධාර කොමිෂන් සභාවේ සේවාවන් ලබාදීමේ දී විශේෂ අවධානය යොමු කරන සමාජ කණ්ඩායම් ඉන්නව ද ?**



ඔව්. වැඩිහිටි අයිතිවාසිකම් වෙනුවෙන් වෙන්වූ ඒකකයක් පිහිටුවා තියෙනවා. මෙම ඒකකයෙන් වැඩිහිටියන්ට අයත් දේපල බැහැර කිරීම්, විශ්‍රාම වැටුප්, දරුවන් විසින් නොසලකා හැරීම වැනි කරුණු සම්බන්ධයෙන් නීති උපදෙස් ලබාදීම සිදු කරනු ලබනවා.

ඒ වගේම විශේෂ පිරිසක් තමයි විදෙස්ගත ශ්‍රමිකයන්. ඔවුන්ට අදාළ වන නීති පිළිබඳව දැනුවත් කිරීම සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට අවශ්‍ය නීති උපදෙස් ලබාදීමත් සිදු කරනවා. විදෙස්ගත වීම හා බැඳුණු අපරාධයන් වන මිනිස් වෙළඳාම සහ මිනිස් ජාවාරම වැනි තත්ත්වයන්ට ලක්ව අසරණ වූවන් වෙනුවෙන් නීතිමය සහාය ලබාදීමත් අප විසින් සිදුකරනු ලබනවා.

බන්ධනාගාර රැඳවියන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට අවශ්‍ය නීති උපදෙස් ලබාදීමත් අප විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ඒකකය මගින් සිදුකරනවා.

කලිනුත් සඳහන් කළා වගේම අපගේ විශේෂ අවධානය යොමුවන පිරිසක් වන්නේ කාන්තාවන් සහ ළමුන්. කාන්තාවන් සහ ළමයින්ගේ අයිතිවාසිකම් සුරැකීමේ ඒකකය මගින් එම කණ්ඩායම්වලට බලපාන නීති පිළිබඳ දැනුවත් කිරීම සහ ඔවුන් ශක්තිමත් කිරීමට කටයුතු කිරීමත් විශේෂයි.

ඊට අමතරව ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ ඒකකය, නීතිමය ලිපිලේඛන සකස් කර දීමේ ඒකකය, පාරිභෝගික අයිතිවාසිකම් සුරැකීමේ ඒකකය ආදිය මගින් වඩාත් හොඳ සේවාවක් ලබාදීමට අපි කටයුතු කරමින් ඉන්න බව කියන්න කැමතියි.

**ඇත්තටම අපි හැමෝටම වැදගත් තොරතුරු අපට කියා දුන්නාට නීති ආධාර කොමිෂමේ නීතිඥ මහත්මයාටත් නෝනාටත් ස්තූතියි !**

මෙම තොරතුරු දැන ගත්ත ඔබට වගේම නීති ආධාර අපේක්ෂාවෙන් ඉන්න හැම දෙනාටම නීති ආධාර කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක පහත සඳහන් 'නීති ආධාර මධ්‍යස්ථාන' විවෘතව පවතින බව සඳහන් කරන්නේ බොහොම සතුටින්...

## බස්නාහිර පළාත

| | |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | - 011 2433618 |
| අවිස්සාවේල්ල | - 036 2233857 |
| අත්තනගල්ල | - 033 2297020 |
| බත්තරමුල්ල | - 011 2877687 |
| බොරැල්ල | - 011 2698003 |
| ගම්පහ | - 033 2248804 |
| හොරණ | - 034 2265244 |
| හෝමාගම | - 011 2748813 |
| කඩුවෙල | - 011 2548150 |
| කළුතර | - 034 2222017 |
| කඩවත | - 011 2922440 |
| මතුගම | - 034 2249262 |
| ගල්කිස්ස | - 011 2718708 |
| මිනුවන්ගොඩ | - 011 2297790 |
| මීගමුව | - 031 2281080 |
| නුගේගොඩ | - 011 2809068 |
| පානදුර | - 038 2244822 |
| පූගොඩ | - 011 2405333 |
| වත්තල | - 011 2935907 |

## දකුණු පළාත

| | |
|---|---|
| කොටුව, ගාල්ල | - 091 2226124 |
| කොටුව, මාතර | - 041 2233815 |
| බලපිටිය | - 091 2255753 |
| හම්බන්තොට | - 047 2221092 |
| තංගල්ල | - 047 2240122 |
| දෙනියාය | - 041 2271128 |
| දෙයියන්දර | - 041 2268077 |
| වලස්මුල්ල | - 047 2245566 |
| තිස්සමහාරාමය | - 047 2239611 |
| බද්දෙගම | - 091 2292051 |

## මධ්‍යම පළාත

| | |
|---|---|
| දඹුල්ල | - 066 2284551 |
| හැටන් | - 051 2222390 |
| මහනුවර | - 081 2388978 |
| මාතලේ | - 066 2224828 |
| නුවරඑළිය | - 052 2235260 |
| නාවලපිටිය | - 054 2224227 |
| ගලගෙදර | - 081 2061025 |

## උතුරුමැද පළාත

| | |
|---|---|
| අනුරාධපුරය | - 025 2224465 |
| හිඟුරක්ගොඩ | - 027 2245521 |
| කැකිරාව | - 025 2263536 |
| කැබිතිගොල්ලෑව | - 025 2298101 |
| පොලොන්නරුව | - 027 2226572 |
| තඹුත්තේගම | - 025 2276259 |

## සබරගමුව පළාත

| | |
|---|---|
| ඇඹිලිපිටිය | - 0472230299 |
| මාවනැල්ල | - 035 2247272 |
| බලංගොඩ | - 045 2289099 |
| රත්නපුර | - 045 2226899 |
| කෑගල්ල | - 035 2231790 |
| වරකාපොල | - 037 2277075 |

## වයඹ පළාත

| | |
|---|---|
| හලාවත | - 032 2222175 |
| මහව | - 037 2275075 |
| ගල්ගමුව | - 037 225329 |
| මාරවිල | - 032 2254443 |
| කුරුණෑගල | - 037 2229641 |
| නිකවැරටිය | - 037 2260203 |
| කුලියාපිටිය | - 037 2284611 |
| පොල්ගහවෙල | - 037 2243039 |
| පුත්තලම | - 032 2266636 |
| වාරියපොල | - 037 2268199 |
| හෙට්ටිපොල | - 037 2291915 |

## නැගෙනහිර පළාත

| | |
|---|---|
| අම්පාර | - 063 2223496 |
| මුතූර් | - 026 2238777 |
| අක්කරේපත්තු | - 067 2279462 |
| පොතුවිල් | - 063 2248485 |
| මඩකලපුව | - 065 2225399 |
| ත්‍රිකුණාමලය | - 026 2226328 |
| කන්තලේ | - 026 2234521 |
| වාලච්චේන | - 065 2258349 |
| කල්මුනේ | - 067 2223710 |
| දෙහිඅත්තකණ්ඩිය | - 027 2250700 |

## උතුරු පළාත

| | |
|---|---|
| චාවකච්චේරි | - 021 2270882 |
| මන්නාරම | - 023 2222045 |
| යාපනය | - 021 2224545 |
| මුලතිවු | - 021 2290077 |
| කිලිනොච්චි | - 021 2285618 |
| පේදුරු තුඩුව | - 021 2260212 |
| වව්නියා | - 024 2221863 |
| මල්ලාකම් | - 021 2059170 |

## ඌව පළාත

| | |
|---|---|
| බදුල්ල | - 055 2225759 |
| මොණරාගල | - 055 2276891 |
| බණ්ඩාරවෙල | - 057 2224733 |
| වැලිමඩ | - 057 2244860 |
| මහියංගණය | - 055 2258332 |
| වැල්ලවාය | - 055 2274466 |
| සියඹලාණ්ඩුව | - 055 2279250 |


**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

UNODC

අංක 129, මහාධිකරණ සංකීර්ණය, අලුත්කඩේ, කොළඹ 12. දුරකතන අංක: 0112 433618

ඊමේල් : legalaidcommission1978@gmail.com / legalaid@legalaid.gov.lk